අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

| ප්‍රාථමික | ත්‍රිපිටක ධර්මඥාන | කාලය පැය - 03 යි. |
|---|---|---|

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

### I - කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. "ත්‍රිවිධ රත්නය" රත්න නමින් හැඳින්වීම සඳහා හේතු වන කරුණු පහකි. ඉන් **හතරක්** ලියන්න.
ii. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් විසින් රචිත **ග්‍රන්ථ හතරක්** නම් කරන්න.
iii. පාරාජික පාලියට අනුව විනය නීති පැනවීමේ අපේක්ෂා දහයකි. එයින් **හතරක්** ලියන්න.
iv. **සතර සංවර** ශීලය නම් කරන්න.
v. නිධිකණ්ඩ සූත්‍රයට අනුව නිධාන **හතර** නම් කරන්න.
vi. චෛතසිකයන්ගේ ප්‍රධාන ලක්ෂණ **හතර** නම් කරන්න.
vii. අෂ්ටාංග සමුපේත බ්‍රහ්ම ස්වරය අතරින් **හතරක්** ලියන්න.
viii. ධම්මානුපස්සනා සතිපට්ඨානයේ ප්‍රධාන කොටස් පහකි. ඉන් **හතරක්** නම් කරන්න.
ix. බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ උපසම්පදා **ක්‍රම හතරක්** ලියන්න.
x. පළමු ධර්මසංගායනාවේ ප්‍රතිඵල **හතරක්** ලියන්න.
xi. මහායානයේ මූලික ඉගැන්වීම් **හතරක්** ලියන්න.
xii. පංච විමුක්තිය හෙවත් කෙලෙසුන්ගෙන් මිදෙන ආකාර පහකි. ඉන් **හතරක්** ලියන්න.
xiii. සත්වයාගේ **සතරාකාර** උත්පත්තිය නම් කරන්න.
xiv. **සතර** කර්මක්ලේශ නම් කරන්න.
xv. දස සංයෝජන අතුරින් **හතරක්** නම් කරන්න.

(ලකුණු 4 x 15 = 60)

II - කොටස

02. සාරාණීය ධර්ම අනුගමනය කිරීමෙන් භික්ෂු සමාජයේ අභිවෘද්ධිය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

03. සංස්කාර ධර්මයන්ගේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ අවබෝධය සාර්ථක භික්ෂු ජීවිතයකට මග පාදයි. විස්තර කරන්න.

04. භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක ලියා, ඉන් එකක් පිළිබඳ ධර්මානුකූල විස්තරයක් ඉදිරිපත් කරන්න.

05. **න භජේ පාපකේ මිත්තේ** යන ගථාව සම්පූර්ණ කොට අර්ථය ලියා, ඉන් ලබාදෙන සමාජ පණිවිඩය පැහැදිලි කරන්න.

(ලකුණු 10 x 04 = 40)